
Page 8 May 2012 .qxd 10/05/2012 19:49 Page 1





# කවි කොළය

## ප්‍රයිවට් චැනල් ප්‍රැක්ටිස්

හිපොක්රිටස් දිව්රිල්ල    වෙනස් කර
අද කාලෙට ඇත ඒක    සකස් කර
නොමිලේ වෙදකම් කෙරුවේ    ඉස්සර
වැඩි පඩි ඉල්ලා සටනකි    දොස්තර

M.B.B.S මුලින්    පාස්කර
ගත් පසු M.D. දැනුම    උසස් කර
කියන්නටත් පෙර ලෙඩාගෙ    විස්තර
Prescription එක ලියන්නෙ    දොස්තර

රුපියල් පණුහෙන් ඇරුඹුණු    ඉස්සර
චැනල් ගාස්තුවෙ මුදල    වෙනස් කර
දාහට දෙදහට තිබෙයි    උසස් කර
මෙය උහුලනු බැරි දඩයකි    දුෂ්කර

හෙද හෙදි සටනකි සමගින්    දොස්තර
ඇදගෙන දඟලති නිතර    දෝස්මුර
මේ දෙව්වරු ඉදිරියෙ    ආබස්සර
ගස් දෙවියෙක් මෙන් ගැහෙයි    මිනිස්ටර

ලොක්කා හොඳ නැහැ එයාව    අස්කර
එතැනට දාපන් මෙයාව    පත්කර
කරන්න ඕනෑ නෝනව    ඉස්තිර
චන්ඩි මල්ලියා වී ඇත    දොස්තර

රජයේ සෙවකයගෙ අද    ඉස්තිර
අවම වැටුප ලෙස ඇත්තෙ    සකස්කර
එකොලොස් දහසකි කුමටද    විස්තර
දන්නවාද එය මහතුනි    දොස්තර !

ආදායම් බද්දෙන් නිදහස්    කර
හොඳ වැටුපක් දුන්නද කර    ඉස්තිර
හතරයි තිහ එළඹෙන්නත්    ඉස්සර
චැනල් එකේ ඇත ගරාන    දොස්තර

ඉස්සර හිටියා හිත හොඳ    දොස්තර
ඇසුවා හොඳ හැටි රෝ දුක්    විස්තර
විනාඩියෙන් අද ලෙඩා    පාස්කර
පටස් ගාල අරිනවා නර්ස්    දොර

රන් වැනි හොඳ හදවත් ඇති    දොස්තර
උතුමෝ සිටියහ නොසැලෙන    ඉස්තිර
මුදලට නොගියෝ දිවිය    උගස් කර
ඒ උදවිය දෙවියෝය    තිදස්පුර

තිබුණත් දහසක්
ජීවිත    දුෂ්කර
කම්කරු වර්ජන
නැත මෙන් ඉස්සර
වැඩවර්ජන කෙළියෙන්
නම්    දොස්තර
පරාද කෙරුවා
බස්    කොන්දොස්තර



♦ **තලන්ගම ජයසිංහ**
**Sri Lanka**

# The Hippocratic Oath
## හිපෝක්‍රැටික් දිව්රුම

The Hippocratic Oath (5th century BC) is an oath historically taken by physicians and other healthcare professionals swearing to practice medicine ethically. It is widely believed to have been written by Hippocrates, often regarded as the father of western medicine. The Hippocratic Oath is one of the most widely known of Greek medical texts. It requires a new physician to swear upon a number of healing gods that he will uphold a number of professional ethical standards.

**හි**පෝක්‍රැටික් දිව්රුම යනු බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා වශයෙන් සැලකෙන හිපෝක්‍රේටිස් නම් ග්‍රීක මහා වෙදැදුරුතුමා විසින් ක්‍රි. පූ. 5 වන සියවසේදී ලියූ පොරොන්දුවීමකි. වෛද්‍යවරයෙකු ලෙස සුදුසුකම් ලබා පිටව යන සෑම වෛද්‍යවරයෙක්ම සියළු දෙවිවරුන්ගේ නාමයෙන් හැමකල්හිම සාධාරණව කරුණාවෙන් යුතුව ලෝකයාට ප්‍රතිකාර කරන බවට දිව්රා සහතිකවීමකි.

# සුබ පැතුම්! Greetings! සුබ පැතුම්!

## ප්‍රශංසනීය පුවත්පතක්!

**ඒ** මීට වසර 15 කට පෙර යුද බියෙන් සමස්ථ ශ්‍රීලංකාවම ඇළලී ගිය කාල පරිච්ඡේද්යක් විය. අප රටෙහි වැසියනට පම ණක් නොව දිවයිනෙන් බැහැරව විදේශගතව ජීවත් වූ අයටද හැම මොහොත කම සිහියට නැගුණේ කොටි ත්‍රස්තවාදයේ ම්ලේච්ඡ භාවය පමණක්යයි සඳහන් කිරීම අතිශ යෝක්තියක් නොවේ. අද මෙන් ශ්‍රීලාංකීය ගුවන් විදුලිය සහ රූපවාහිනී විකාශන, අන්තර්ජාල ප්‍රවෘත්ති මාධ්‍යයන් ආදියෙන් ශ්‍රීලංකාව පිළිබඳ උණුසුම් ප්‍රවෘත්ති අපට දැනගැන්මට නොහැකි අවධියක් විය.

තත්වය මෙසේ තිබියදී අපේ මව්බසින් දිවයිනෙන් බැහැරව පලවන ප්‍රථම ප්‍රවෘත්ති පත්‍රය වශයෙන් ලංකාවිත්තිය ඔබ අතට පත්කිරීමට දයා ආනන්ද රණසිංහ යන් ගත් ප්‍රයත්නය කෙසේ නම් වචනයෙන් අගය කළ හැකිද? විවිධ ආර්ථික බාධකයන් ඉදිරියේ දෛනික රැකියාවෙන් පසු ලැබෙන සුළු විවේකයද මුලුමනින් පුවත්පත වෙනුවෙන්ම කැපකරමින් අපේ මව්රට, මව් බස උදෙසා දයා රණසිංහයන් අද දක්වාම කරගෙන යන මෙම උදාර කර්තව්‍ය සුළුපටු නොවේ.

එය අතිශයින්ම ප්‍රශංසනීයය. මුළු මහත් ජාතියේ ප්‍රණාමය ලංකා විත්ති සමස්ථ කායයී මණ්ඩලය වෙත පුදකිරීම ඔබ අප කාගේත් යුතුකමක් බව නොකියමනාය. අපේ ලංකාවිත්තිය තව චිරාත් කාලයක් දිනෙන් දින දියුණුවට පත්වෙමින් වැජඹේවායි අපි ඉත සිතින් ප්‍රාර්ථනය කර සිටින්නෙමු.

♦ ***ජයරත්න විජේකෝන් සහ ශ්‍රීමති විජේකෝන් ශ්‍රීලංකා ජයහඬ***
**Danderyd Sweden**

## දිගුකල් දිනේවා සුන්දර පුවත්පත!

**ල**ංකා විත්ති පුවත් පතේ **15** වන සංවත්සර කලාපය ගිය මස පළවුණා. එය කියවලා එහි තිබූ පණිවුඩ දැකලා මට මේ අදහස් ලියා එවන්න හිතුණා.

මට මතකයි ලංකාවිත්ති පුවත්පතේ මුල්ම කලාපය බලන්න ලැබුණු හැටි. ලන්ඩන්වල කොහේ දිද කියලා දැන් මතක නෑ. එදා ඒ පත්තරය කියවන විට මට විසාල සතුටක් ඇතිවුණා.


එදා ඉඳලා හැම මාසෙම පුවත්පත එනකල් අපි නොයිව සිල්ලෙන් බලාගෙන හිටියා. හුඟක් වෙලාවට පත්තරය ලැබෙන්නේ ලන්ඩන් ගියාම පන්සලෙන්. පත්තරේ ගන්නකොට මම දැකලා තියනවා තව හුඟක් පන්සලට ආපු අය අනික් පත්තර ගන්නෙ නැතිව ලංකාවිත්ති විතරක් අර ගෙන යනවා. පත්තරේ තිබුණේ නැත්නම් අනේ ලංකා විත්ති නැනේ කියනවා නැත්නම් කෝ ලංකාවිත්ති කියනවා. ලංකාවෙ ඉන්න අපේ අක්කලාටත් මම පත්තරේ යවනවා. ප්‍රමාද වුණොත්, ආවෙ නැත්තෙ ඇයි? එවන්නකො කියනවා. පළවෙනි වරට පිට දේශයක පළවුණු ප්‍රථම සිංහළ පුවත්පත. මම හුඟක් සිංහළ පත්තර සහරා කියවලා තියනවා, ඒත් මේ වගේ පත්තර යක් කවදාවත් කිසිම තැනක පළවෙලා නැහැ. ඒ වගේම මීට සමාන වෙන්න පුවත්පතක් නොපළවන බව මට විස්වාසයි. එහි මුහුණුවර, හැඩ ගැස්ම සහ ඇතුළත්ව ඇති දේවල් ප්‍රශංසනීයයි.

ලංකාවිත්ති මුල් පිටුවෙ ඉහළින්ම ලියා ඇති මවත් මවුබිමත් ස්වර්ගයට වඩා උතුම්ය යන වගන්තියත්, සිංහ කොඩියත් පෙන්වන්නේ කතෘතුමා මවට, උපන් දේශයට, ජාතියට හා භාෂාවට දක්වන ආදරය සහ ගෞරවය. එසේම මේ පුවත්පත බෙදාහරින්නෙ නොමිළේ. එය කොතරම් නිහතමානී නිහඬ සේවයක්ද? වටිනා ධර්මානු ශාසනා, අර්ථවත් රසවත් ලිපි, හාස්‍ය ගෙනෙන කතා, කවි. කවියන් කිවිදියන් වෙනුවෙන් පිටුවක්ම වෙන්කරලා තියනවා. එසේම කවිකොළය, ඉන්දු ලතාගෙ දිනපොත, වෙලේගෙදර රාළ, ඇත්ත කෙටිකතාව, ලංකා වෙ සාහිත්‍ය, සංගීත හා සිනමා ලෝකයේ විස්තර පමණක් නොවෙයි, හින්දි, ඉංග්‍රීසි නළුනිළි ගායක විස්තර. විහිළුතහළු, ඉවුම්පිහුම්, හරස්පද ප්‍රෙහේළිකා, මරණ දැන්වීම්, සිංහළ පාඩම්, මේ හැමදේකින්ම සම්පූර්ණයි. විසාල පුවත්පතක අඩංගු හැම දෙයක්ම මේ පුංචි ලංකාවිත්තියේ අඩංගුයි. ඒකයි මම කියන්නෙ මේ වගේ පත්තරයක් වෙන කොහේවත් නෑ කියලා.

මේ සියල්ල මේ පුවත්පත තුළ සිටින කතුවරයාගේ දක්ෂතා බව කවුරුත් අද හඳුනාගෙන තිබෙනවා. ඔහුගේ පත්‍ර හා ලේඛන කලා දැනුම, කවිත්වය, මානව දයාව, දේශ ප්‍රේමය, නිර්මාණශීලීබව, මෙන්ම හාස්‍ය උත්පාදනය ආදී මේ හැම දෙයක්ම මේ පුවත්පත තුළින් අපට දකින්නට හැකියි.

ලංකාවිත්ති පුවත්පත තව බොහෝ කාලයක් අප අතට ලැබේවායිද, එය ඉදිරියටත් කර ගෙන යාමට අවශ්‍ය ධෛර්‍යය හා නිරෝගි බව ද කතුතුමාට ලැබේවායි ද ඉත සිතින් පතමි.

♦ ***කුමුදුනී වාහලතන්ත්‍රි***
**Cheshire, UK**




**ඉරිදා**- ලංකාවට, අපේ ගෙදරට නැවේ ඇරපු බඩු හම්බ
**SUN** වෙලා සති තුනකටත් වැඩියි, ඒත් හම්බවෙච්ච බවක් කිසිකෙනෙක් කියලා එව්වෙ නෑ. බැරිම තැන මම අපේ ගෙදර ටෙලිපෝන් නැති හන්දා කිත්සිරිලයි ගෙදරට කතා කෙරුවමයි දැනගත්තෙ. අපේ පොඩි නංගි කිව්වලු, එයාට දන්වන්න මතක නැතිවුනයි කියලා. හැබැයි මෙහෙන් මොනව හරි ගෙන්න ගන්න ඕන වුනාම ලියුම් පිට ලියුම් ලියනවා. පාන්දර දෙකට තුනටත් මෙහාට ටෙලිපෝන් කරනවා. අක්කලා තාම නිදිද? අපෝ අපි මේ වැඩට යන්නත් ලෑස්තිවෙනයි කියනවා.

**සඳුදා**- ලන්ඩන් නගරාධිපති තේරීමේ තරගෙ ඉවරයි.
**MON** බොරිස් ජොන්සන් යන්තම් බෙල්ල දාගත්තා. මුළු ලෝකෙම ඉන්න හැම ඡන්ද අපේක්ෂකයෙක්ම කියන්නෙ ඒ අය බලේට ආවම කරන හොඳ වැඩ. හැබැයි ඒ එකක්වත් සිද්ධ වෙන්නෙ නෑ. මට මතක් වුණා ජාඇල හිටපු පීනපාලද සිල්වා වෙදමහත්තෙයා. ඒ මහත්තෙයා ලෙඩකට බෙහෙත් දෙන ගමන් කියනවා. පතෝල වැටකොළු වගේ එළෝලු ජාති කන්න. හොඳ හොඳ එළවළු හොඳයි. කියලා. හොඳ දේවල් කොහොමත් හොඳ තමයි. හැබැයි වෙද මහත්තෙයා වත් ඒවා කන්නෙ නෑ. ඡන්ද අපේක්ෂකයොත් කියන දේවල් ඔක්කොම හොඳයි. ඒත් බලේට ආවම කරන්නෙ සම්පූර්ණයෙන්ම වෙන දේවල්.

**කුජදා** - හම්බන්තොට අළුත හදපු වරාය මැද්දෙ විසාල
**TUE** ගලක් තිබුණයි කියලා පහුගිය කාලෙ ලෙකු කතාවක් ගියා. සමහරු කිව්වා ඒක බොරුවක් ආණ්ඩුවට මඩගහන්න ගොතපු කෙබරයක් කියලා. නමුත් පස්සෙ දැනගත්තා ඒක ඇත්ත කියලා. වරාය හදද්දී ඒ ගල කවුරුවත් දැක්කෙ නැත්තෙ ඇයි කියන එක නම් පුදුම යක් තමයි. නැවක් එන්න බැරි තරම් ගලක් කියන්නෙ නිකම් බොරලු කැටයක් නෙවෙයි විසාල පර්වතයක් ෙ වන්න ඕන නේද ? කොහොම හරි දැන් ඒ ගල පුපුර වලා ඇරලා අන්න දැන් නැව් වරායට යනවලු බඩු බානවලු. ඒ බඩු සේරම වෙන මොනවත් නෙවෙයි පිට රටින් ගෙන්නපු කාර්. හුංගම ජයසේන අයියා අපිට කියලා එව්වෙ. එයා ඒ වරායෙ දැන් වැඩ කරන්නෙ.

**බුදදා -** ලංකාවෙ බඩු මිළ හරියට ඉහළ ගිහිල්ලා පැට්‍රල්
**WED** ඩීසල් සේරම උඩ ලයිට් බිල් අහස උසට දුවලා තැපැල් ගාස්තු වැඩිවෙලා. වැඩිවෙලා නැත්තෙ මිනිස්සුන්ගෙ පඩි විතරයි. ඒත් මිනිස්සු ඉවසගෙන ඉන්නවා. පානුයි පරිප්පුයි කන්නවත් බැරි තත්වයක් අද හෙටම ඒවිය කියලා කැතරින් කුඩම්මා ගිය සුමානෙ ලියලා එවලා තිබුණා. පදවිදෙන්න දුවලා දෙන්නෙක් ඉන්නවා. උන්ට වළලු ජෝඩුවක්වත් හදවලා දෙන්න විදියක් නෑ කියලා කුඩම්මා දුක්වෙනවා. මන්ත්‍රීවරුන්ගෙ ඇමතියෙකුගෙ දරුවෙකුගෙ මගුලකට යන වියදම රුපියල් කෝටි එකහමාරයි දෙකයි. මෙන්න අපේ රට! මෙන්න අපේ නායකයො. අයියෝ කියලා වැඩක් නෑ!

**ගුරුදා -** රත්නාවලී පුංචි අම්මලා මේ මාසෙ අන්තිමට
**THU** දඹදිව යනවා. මට හරි ආසයි අපේ අම්මවත් දඹදිව යවන්න. ගිය අවුරුද්දෙ දඹදිව යන්න කියලා මම අම්මට යවපු සල්ලි අම්මා පොඩි අක්කගෙ දුවගෙ කොටහලු මගුල්වලට වියදම් කරලා. ඒක මම දැනගත්තෙ පස්සෙ. මට හරි කේන්තියි. අක්කලා නැතිබැරි මිනිස්සු නෙවෙයි. මොකටද අම්මට කියලා වියදම් කෙරෙව්වෙ? “ නංගි අම්මට ආයිත් සල්ලි එවන්නෙ නැතැයි ” කියලා අක්කා කිව්වලු. අපේ අමාරුකම් ඒ ගොල්ල දන්නෙ නෑ. මේක මහ රැජිණගෙ රටනේ. ඒ ගොල්ල හිතන්නෙ එහෙමයි.

**කිව්දා -** කොටි ත්‍රස්තවාදෙ විනාස කරලා ඒ සාපෙන්
**FRI** ලංකාව මිදිලා මේ මාසෙ 19 වෙනිදට අවුරුදු තුනක් වෙනවා. කී දෙනෙක් අපේ රටේ ආපහු හැරිලා බලන වද කියලා දන්නෙ නෑ. දැන් හුඟ දෙනෙකුට ඒවා මතක නෑ. ඒ විපත්ති කිසි දෙයක් මෙහේ ඉන්න අපට මූණ පාන්නවුණේ නැතත් ඒ දුක හැතැප්ම හත්දාහක් මෙහාටත් අපිට ඒ කාලෙ දැනුණා. ආයිත් එහෙම දෙයක් නොවෙව්වා කියලා ප්‍රාර්ථනා කළාට මදි. එහෙම දෙයක් නොවෙන්න විශේෂයෙන් සිංහළ මිනිස්සු පරීක්ෂාකාරී වෙන්න ඕන. ඒක නම් මට සැකයි. රජයෙ ලොකු ලොක්කොයි, කොළඹ ඉහළ පෙලැන්තියයි, ර්යෙ පෙරෙයිදා පොහොසත් වෙච්ච මුදලාලිලයි දැන් හැසිරෙන විදියෙන් ඒ බව හොඳට පේනවා. ජීවිතේ දීපු රණවිරු තරුණයො ගැනයි මං දුක් වෙන්නෙ.

**ශනිදා -** ශ්‍රීලන්කන් ගුවන් සේවයේ මගීන්ට සලකන හැටි
**SAT** ගැන එන ආරංචි එන්න එන්නම නරකයි. කලින් එයාර් ලංකා සේවයෙ පැත්ත පළාතකින් තියන්න බැරිය කියලා දැන් ලංකාවට යනඑන අය පලුයන්න බනිනවා. සේරම තියෙද්දී ලංකාවෙ මිනිස්සුන්ට හරියට කෙනෙකුට කතා කරන හැටි උගන්නන්න ඕනය කියලා. Customer care Public relation කියන දේවල් ලංකාවෙ කිසිකෙනෙක් අහලවත් නෑ. දන්නෙත් නෑ. ඒවා කියලා දෙන්න කෙනෙකුත් එහේ නෑ. ලංකාවෙ මොන සේවෙ ගැනත් එච්චරයි. ලංකාවෙ බේකරියකට පාන්ගෙඩියක් ගන්න ගියත් අපේ අහස්යාත්‍රාවක නැග්ගත් එකම තමයි. වෙනසක් නෑ.